කවරයේ කතාව

# මතට ඇබ්බැහි වීමත් තාක්ෂණයට ඇබ්බැහි වීමත් එක හා සමාන ය

**ප්‍රාථමික පරාසයක සිට පුළුල් පරාසයකට ව්‍යාප්ත වූ සන්නිවේදන මාධ්‍ය පිළිබිඹුව නැවත පටුවීයන සෙයක් දක්නට ලැබේ. අද ජන රසාස්වාදය රූපවාහිනියට සීමා වී තිබේ. එමගින් විශාල සතුටක්, සංකීර්ණ සිතුවිලි සමුදයක් අප ලබන බව පිළිගත යුතු ය. එසේ තෘප්තියක් ලබන්නේ චින්තන ශක්තිය වෙළෙඳ ආධිපත්‍යයට යට කරවමිනි. අන් පාර්ශවීය බලපෑමක් ස්ව චින්තාවලියට එක් වූ විට මිනිසාට ස්වාධීන දැක්මක් අරමුණක් නොමැතිවීම අරුමයක් නොවේ.**

වර්තමානය වන විට විනෝදස්වාදය දෘෂ්‍ය උපකරණ ඉතා කුඩා වී වටිනාකම ඉහළ ගොස් ඇත. නව යුගයේ මිනිසාගේ මූලික අවශ්‍යතා අතරට දෘෂ්‍ය උපකාරණ භාවිතය ද ඇතුළත්ව ඇත. දෘෂ්‍ය මාධ්‍යයන්හි නවතම පෙරළිකාර හඳුන්වාදීම වන්නේ ජංගම දුරකථනයේ අන්තර්ගත රූපවාහිනියයි.

බ්‍රිතාන්‍යය, ඉතාලිය, සයිප්‍රසය ආදී රටවල මිනිසුන් මෙම ජංගම දුරකතන(Tivo) සඳහා අති විශාල මුදලක් වියදම් කරති.

ප්‍රධාන පාපන්දු තරගයක් අවසන මිනිත්තු පහක් ගත වූ කළ එහි විශේෂ අවස්ථා මිනිත්තු දෙකක් නැරඹීමේ හැකියාව බ්‍රිතාන්‍ය වැසියන්ට ලැබී ඇත්තේ නවතම ජංගම දුරකථනයේ පිහිටෙනි. එංගලන්තයේ ජංගම දුරකතන සැපයුම් ආයතනයක් වන OZ ආයතනය නොකියා සමාගම සමඟ ගිවිසුමකට එළඹ ඇත. ඔවුන්ගේ අරමුණ ජංගම දුරකතන සඳහා නිපදවූ චිත්‍රපට උළෙලක් සංවිධානය කිරීමයි. මේ අතර Fox Mobile Entertainment (FME) ආයතනය ජංගම දුරකතන රූපවාහිනී ප්‍රදර්ශන සඳහා අවසර ලබා ගෙන ඇත. "Mobisoda" නමින් තම ව්‍යාපෘතිය ආරම්භ කරමින් Fox's 24 නමැති දුරකතනය සඳහා චිත්‍රපටයක් නිපදවා ඇත. පැයක ධාවන කාලයක් හිමි Conpiracy නම් චිත්‍රපටයෙන් උපුටා ගත් කොටස් මඟින් විනාඩියක චිත්‍රපටයක් ජංගම දුරකතනය සඳහා නිපදවා ඇත. එය භාෂා හයකට පරිවර්තනය කර ඇති අතර භාෂා තිහකට පරිවර්තනය කිරීම වසර අවසාන වීමට පෙර සිදු කිරීම ඔවුන්ගේ ඉලක්කයයි.

FME ආයතනයේ සභාපති ලකී හුඩ් මහතා පවසන්නේ කෙටි දෙබස් සම්බන්ධයක් මගින් ක්‍රියාදාමයන් සිදු නොවන බවත් දූෂණයක්, ද්‍රෝහිවීමක්, මිනී මැරීමක්, වරද කර හසුවීමක් ඇතුළත් චිත්‍රපටයක් නිපදවීමට බලාපොරොත්තු වන බවත් ය.



Tivo ක්ෂේත්‍රයේ මීළඟ නවාංගය බිහිවන්නේ මෙම මසදී එංගලන්තයේ ඔක්ස්ෆර්ඩ් හි දී ය. OZ සමාගමBBC මෙන් පැය විසි හතර පුරා ක්‍රියාත්මක ප්‍රවෘත්ති සේවාවක් මෙන්ම කෙටි චිත්‍රපට නාලිකාවක් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

බ්‍රිතාන්‍ය ජංගම දුරකතන වෙළෙඳපොළ තුළ කළ පර්යේෂණයකදී හෙළි වී ඇත්තේ දැනට සජීව රූපවාහිනී වැඩසටහන් නරඹන්නේ 1 30 000 පිරිසක් පමණක් බව ය. එහෙත් 2010 වර්ෂය වනවිට ලෝකයේ මිලියන 125 ක් වූ ජනතාවක් ඉහත පහසුකම ලබාගනු ඇත. එයට ද කොරියාවෙන් විශාල දායකත්වයක් ලැබෙනු ඇත. තව ද යුරෝපීය රටවලින් පමණක් මිලියන 31 ක ජනතාවක් එක්වන බවට ගණනය කර ඇත. Frost Sullivan analyst pranab mookken ආයතනය අනුමාන කරන පරිදි වර්ෂ 2010 වනවිට යුරෝපය තුළ Tivo ඩොලර් බිලියන ගණන් උපයන ව්‍යාපාරයක් වනු ඇත.

කුඩා කාල පරාසයක් තුළ දිවෙන වැඩසටහන් ග්‍රාහකයන් හට කුමන බලපෑමක් කරාවිද? යන ප්‍රශ්නයට පිළිතුරු සෙවූ Iconoclture නම් ඇමරිකානු පාරිභෝගික සමීක්ෂණ ආයතනයේ ජොනතත් ස්ටීවුර් ප්‍රකාශ කරන පරිදි මත්ලෝලියකු මෝර්ෆීන්වලට ඇබ්බැහි වූවා හා සමානව මිනිසා තාක්ෂණයට ආකර්ෂණය වී ඇත. තාක්ෂණික නව උත්පාදන බිහි වෙත්ම මිනිසා එයට යොමු වෙයි. ස්ටීවුර් මහතා තම ළමා කාලයට සමගාමීව ද අදහස් දක්වමින්... "මම වයස අවුරුදු

කුඩා කාල පරාසයක් තුළ දිවෙන වැඩසටහන් ග්‍රාහකයන් හට කුමන බලපෑමක් කරාවිද? යන ප්‍රශ්නයට පිළිතුරු සෙවූ Iconoclture නම් ඇමරිකානු පාරිභෝගික සමීක්ෂණ ආයතනයේ ජොනතන් ස්ටීවුර් ප්‍රකාශ කරන පරිදි මත්ලෝලියකු මෝර්ෆීන්වලට ඇබ්බැහි වූවා හා සමානව මිනිසා තාක්ෂණයට ආකර්ෂණය වී ඇත. තාක්ෂණික නව උත්පාදන බිහි වෙත්ම මිනිසා එයට යොමු වෙයි.

හතරේදී රූපවාහිනිය තුළින් සුවිශේෂී දර්ශන පෙළක් අපේක්ෂා කළා. එයින් මට නොසන්සුන් මනසක් ලැබුණා විනා ජීවිතය යහපත් අත්දමින් පවත්වාගත යාමට උපදේශයක් ලැබුණේ නැහැ."

Every thing bad is good for you නමින් කෘතියක් රචනා කරන ස්ටීවන් ජොන්සන් නැමැත්තා රූපවාහිනියෙන් වැදගත් දෙයක් නොලැබීම යන අදහසට විවේචනයක් ඉදිරිපත් කර ඇත. "මෙතෙක් රූපවාහිනිය මගින් ඉදිරිපත් කර ඇත්තේ ඒකාකාර වැඩසටහන් ය. එහෙත් අද මානව හැකියාවන් ඔප්නංවන වැඩසටහන් ඉදිරිපත් කරයි."

පසුගිය දසකය තුළ ජන විඥනය පටු කිරීම උදෙසා විශ්ෂයෙන් දෘෂ්‍ය උපකරණ මහගු දායකත්වයක් සපයා ඇත. Iconoculture හි සමීක්ෂක කිර්ක් ඕල්සන් පවසන්නේ මෙවර හොලිවුඩ් චිත්‍රපට උළෙලේ චිත්‍රපට දිගු වුවද නවීන සමාජයත් සමග එය සාර්ථකත්වයක් ලෙස දක්විය නොහැකි බවය.

"DVD, DVR, TIVO ආදියේ අන්තර්ගතව ඇත්තේ ;කටි ධාවන කාලයක් හිමි වැඩසටහන්ය.

සම්පූර්ණ ගීත එකතුවක් හෝ චිත්‍රපටයක් හෝ රස විඳීමට අපට අනවශ්‍යය. අප සිතන්නේ ජීවිතය ගැන නොව ගතකරන මොහොත පිළිබඳ ය" ඕල්සන් මහතා වැඩිදුරටත් එසේ අදහස් දක්වා ඇත.

මෙම මසදී Motorola Rokr නමින් නව ජංගම දුරකතනයක් එළිදක්වා ඇත. අවශ්‍ය සංගීතාංග ලබා ගැනීම පින්තූර හා විද්‍යුත් තැපැල් පහසුකම් මෙහි සතුව ඇත. ජංගම දුරකතන සමාගම් ඔවුන්ගේ ඉලක්කයන් හෙළි නොකළද Mookken ආයතනය ප්‍රකාශ කරනුයේ 2006 ලෝක කුසලානය, 2006 ඔලිම්පික් තරගාවලියTIVO ක්ෂේත්‍රයේ පෙරළියක් සිදු කරනු ඇති බව ය. චීනය පවසන්නේ Digital ඔලිම්පික් තරගාවලියක් පැවැත්වීමට අවශ්‍ය බවයි. ❑

පුබුදු කිත්සිරි